

## මේ පොත අයිති

.....................................

# පාළු මකන මගේ යාළු

දිශානි සේනාරත්න

අරමුදල් සැපයීම

පරිපාලන සහයෝගය

Sarvodaya

# පාළු මකන මගේ යාළු

දිශානි සේනාරත්න

ප්‍රථම මුද්‍රණය 2019

ISBN 978-624-95666-0-6

© දිශානි සේනාරත්න
සියලුම හිමිකම් ඇවිරිණි

කවරය සහ අභ්‍යන්තර චිත්‍ර : සරසි ගුණසේන

ප්‍රකාශකයාගේ පූර්ව අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක්
උපුටාගැනීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික හෝ විද්‍යුත් චුම්බක ආදී කවර මාධ්‍යයකින් හෝ
ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, පලකිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම සහ
ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

මුද්‍රණය

දර්ශන මාර්කටින් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්,
107, කඩුවෙල පාර,
බත්තරමුල්ල.
0112 86 78 70

# පිදුම

ආදරණීය සඳිති සහ රදින් වෙත පුංචිගෙන්

# පෙරවදන

කුඩා දරුවන්ගේ සුන්දර ළමා ලෝකය වෙත මාහට කතන්දරයකින් සමීප වීමට **Writing Doves** ව්‍යාපෘතිය සඳහා 'කුඩා හා විශේෂ අරමුදල් ප්‍රතිපාදන වැඩසටහන' හරහා අරමුදල් ලබා දුන් ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ පරිපාලන සහයෝගය ලබා දුන් සර්වෝදය ආයතනය වෙත මම ප්‍රථමයෙන් ස්තුති කරමි.

මෙම නිර්මාණය එළි දැක්වීමට මට නන් අයුරින් සහය ලබා දුන් දර්ශන මාර්කටින් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් අධිපති දර්ශන රුලපනාව සහ එම කාර්ය මණ්ඩලයේ සිතුම් ජයසිංහ යන මහත්වරුන් මෙන්ම චිත්‍ර ශිල්පී සරසි ගුණසේන මහත්මිය වෙත මාගේ කෘතඥතාව පළ කරමි.

මාගේ ලේඛන කටයුතු නිතරම දිරිමත් කරන ආදරණීය අම්මා, තාත්තා, අක්කා සහ අයියා මගේ ශක්තියයි.

දිශානි සේනාරත්න



තිළිණිගේ ගෙදර වත්ත පුරාම මල් පිපිලා හරිම ලස්සනයි. හැමදාම හවසට තිළිණි සුරතල් ටොමී එක්ක මිදුලේ සෙල්ලම් කරනවා.





එක දවසක් තිළිණි ඉස්කෝලෙ ගිහින් එනකොට වහලා තිබුණු ඉස්සරහ ගෙදර ඇරලා තියෙනවා දැක්කා.







"ඉස්සරහ ගෙදරට කවුද ඇවිල්ලා තියෙන්නේ ?"
තිළිණි අම්මාගෙන් ඇසුවා.
"කවුද කියල නම් දන්නේ නැහැ. හැබැයි ඔයා
වගේම පුංචි පුතෙක් ඉන්නවා දැක්කා," අම්මා
තිළිණිගේ හිස අත ගාමින් කීවා.







“මොනවද ඒ දොර ළඟ බිම ඇඳලා තියෙන්නේ ?” ජනේලයෙන් එළිය බලමින් තිළිණි අම්මාගෙන් විමසුවා.

“අපි හවසට එහෙ යමු. අපි ඒ නැන්දාගෙන් ම අහමුකෝ.”







තිළිණි ඉතා කඩිසරව ඇඟපත සෝදාගෙන කෑම කන්න පටන් ගත්තා. ටොමි තිළිණිගේ මේසය යටට ආවා.







“දුව අපි තව ටිකකින් වැලිතලප හදමු අළුත් යාළුවගේ ගෙදර ගෙනියන්න,” අම්මා කුස්සියට ඇතුල් වුණා.

“එහෙනම් අම්මේ මමයි ටොමියි දෙන්නම උදව් කරන්නම්,” තිළිණි සතුටින් කීවා.

ටික වේලාවකට පසු වැලිතලප සුවඳින් මුළු ගෙදරම පිරී ගියා.







"දුවේ තාත්තාගේ වැලිතලප ටික වහලා මේසය උඩින් තියන්න."

"හා අම්මේ .... අන්න ටොමී අපිටත් කලින් ඒ ගෙදරට යනවා."





"එන්න එන්න ගේ ඇතුළට. අපට හරි සතුටුයි
ඔයාලා ආපු එකට."
"නැන්දේ මෙන්න ඔයාලට අපෙන් පොඩි තෑග්ගක්."
"බොහොම ස්තූතියි."







“මොකක්ද දුවගේ නම ?”

“තිළිණි.”

“හරිම ලස්සන නමක්...... රාජු, මෙහෙ එන්න පුතේ.
මෙන්න අළුත් යාළුවෙක් ඇවිත්.”

“අපට දැන් පාළු නැහැ. ඔයාලා ඉන්නවානේ,”
තිළිණිගේ අම්මා කීවා.





රාජුත් තිළිණිත් ටොමිත් ගොඩක් වෙලා සෙල්ලම් කළා.

"ටොමී හැමතැනම දුවනවා. අපි එයාව අල්ලමු," තිළිණි හයියෙන් කීවා.







"පුතේ පරිස්සමින් ! බිම රටා ඇඳලා තියෙනවා," තිළිණිගේ අම්මා අවවාද කළා.

"මොනවද ඒ රටා ?" තිළිණි පුදුමයෙන් ඇසුවා.

"කෝලම්, ඒ කියන්නේ මල් රටා. අපේ අළුත් ගෙදරට දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගන්න කෝලම් රටා අඳිනවා," රාජුගේ අම්මා කියල දුන්නා.





"අපි දැන් තේ බොමු. වැලිතලපත් තියෙනවා, ලඩ්ඩුත් තියෙනවා," රාජු හැමෝටම කතා කළා.
"ම් ..... ම්..... ලඩ්ඩු හරිම රසයි," තිළිණි රාජුට කීවා.

"අපි හෙට ඔයාලගෙ ගෙදර එන්නම්," වැලිතලප රස බලමින් රාජු කීවා.

"මං දුවට කෝලම් රටා අඳින්නත් කියලා දෙන්නම්කෝ," රාජුගේ අම්මා තිළිණිගේ අතින් අල්ලා ගත්තා.

තිළිණි හිස වැනුවා.
ටොමි සතුටින් උඩ පැන්නා.





# Writing Doves

**Writing Doves** ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති කාර්යාලය මගින් ක්‍රියාත්මක 'කුඩා හා විශේෂ අරමුදල් ප්‍රතිපාදන වැඩසටහන' හරහා අරමුදල් ලබාගනිමින් සර්වෝදය ආයතනයේ පරිපාලන සහයෝගයෙන් ක්‍රියාත්මක විය. එහි අරමුණ ත්‍රිභාෂා කතන්දර මගින් කුඩා දරුවන්ගේ අන්තර් සංස්කෘතික අවබෝධය නැංවීමයි.

**www.writingdoves.lk**

**https://www.facebook.com/WritingDoves/**



දිශානි සේනාරත්න විසින් ලියන ලද ඉංග්‍රීසි කාව්‍ය සහ කෙටි කතා ***Write to Reconcile, FemAsia*** සඟරාව සහ ***ActiveMuse*** හි ප්‍රකාශයට පත් වී ඇත. ඇය ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතුවල ද නිරත වන අතර ***South East Asia( Advancing Inter-religious Dialogue and Freedom of Religion or Belief (SEA AIR FoRB) Interfaith Fellowship*** වැඩසටහනෙහි නිරතව සිටී.